06

# මින්නේරියට චාරිකාවක්



"මෙවර පාසල් නිවාඩුවට චාරිකාවක් යමු" යැයි අක්කා යෝජනා කළා ය. චාරිකාව සඳහා සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට නොයෙක් යෝජනා ඉදිරිපත් විය. මින්නේරිය වැව බැලීමට යාමට කවුරුත් අවසානයේ දී කැමැති වූහ. ආපසු එන ගමනේ දී හබරණ සිටින පොඩි මාමාගේ ගෙදර යාමට හැකි වීම පිළිබඳ ව ද අප තුළ සතුටක් ඇති විය. මේ ගමනට චමරිලාගේ සීයා ද සහභාගි කරවා ගත යුතු බව තාත්තාගේ අදහස විය. චමරිලාගේ සීයා බොහෝ දේවල් පිළිබඳ දැනුම් තේරුම් ඇති අයෙකු වීම මීට හේතුව බව අම්මා පැවසුවා ය.

අපි පළමු ව ගමන ආරම්භ කිරීම සඳහා නිවසින් පිට වී රිදී විහාරය වෙත පා නැගුවෙමු. එහි දී මල් පහන් පුදා තුනුරුවන්ගේ ආශිර්වාදය ලබා ගතිමු.

සීයා : පුතාලා දන්නවා ද මේ විහාරයට "රිදී විහාරය" කියන්නේ ඇයි කියලා.

මාලක : රුවන්වැලි සෑය තැනවීමට අවශ්‍ය රිදී ලැබුණ ස්ථානය මෙතන නිසා මේ විහාරය "රිදී විහාරය" ලෙස හැඳින්වෙනවා නේ ද සීයේ?

සීයා : ඔව්, ඔව්, මෙතනින් රිදී ගොබයක් මතුවුණා කියලා කියනවා.

චමරි : සීයේ, මේ විහාරයේ හාස්කම් තියෙනවා කියනවා නේ ද?

සීයා : ඔව්, ඔව්, මේ ස්ථානය ශුද්ධ භූමියක් නේ! ඒ නිසා දෙවි දේවතාවුන් වහන්සේලාගේ බැල්ම, ආරක්ෂාව තියෙනවා.

මලිති : මොකද අම්මලා පේන්න නැත්තේ?

මාලක : පන්සලේ ලොකු හාමුදුරුවන්ට කතා කරන්න යන්න ඇති.

චමරි : අපි අම්මලා එනතුරු වාහනයට යමු ද?

මලිති : නෑ, අපි අම්මලා එනතුරු මෙතන ඉමු.

පුබුදු : ඔයාලා ඇයි මින්නේරියට යන්න තීරණය කළේ?

මාලක : අපේ පොඩි මාමලා ඉන්නේ හබරණ. අපට අද මින්නේරිය වැව බලලා ආපසු එන ගමනේ දී හබරණ ඉන්න පොඩි මාමලාගේ ගෙදර නවතින්න පුළුවන් නිසා තමයි මින්නේරියට යන්නේ.

සීයා : පුතාලා දන්නවා ද? මින්නේරිය වැව හැදුවේ කවුද කියලා.

පුබුදු : මහසෙන් රජතුමා නේ ද?

සීයා : මේ වැව හැදීම ගැන රසවත් කතාවක් තියෙනවා කියලා පුතාලා දන්නවා ද?

මාලක : අනේ, සීයේ, ඒ කතාව කියන්නකෝ.

සීයා : මහසෙන් රජතුමා සිරිතක් වශයෙන් රටතොට ඇවිද්දා. එහෙම යනකොට එක පළාතක දි හරි ම රස කිරි බොන්න ලැබුණා. ඒ තරම් මිහිරි කිරි රජ්ජුරුවො කවදාවත් බීලා තිබුණෙ නෑ.

මාලක : ඉතින් සීයේ, ඒ කිරි එතරම් රස වෙන්න හේතුව මොකද්ද?

සීයා : ඒකට හේතුව රජතුමා සොයා බැලුවා.

මලිති : රජතුමා ඒක සොයා බැලුවේ කොහොම ද සීයේ?

සීයා : ඒ ගැනත් රසවත් ජනප්‍රවාදයක් තියෙනවා.

පුබුදු : අනේ! සීයේ, ඒ කතාව කියන්නකෝ.

සීයා : මේ කාරණය හොයන්න රජ්ජුරුවො කදිම උපායක් යෙදුවා.

මාලක : මොකද්ද සීයේ ඒ?

සීයා : ඒ පළාතේ ගවයන් නියං කාලයේ දී තණ කෑමට ලිහා දමනවා. ඉතින් උන් වනාන්තරයේ ඈතට ගොස්, තණ කා වතුර බී නැවත එනවා. ඒ හින්දා ගවයෙකු ලවා ඒ පිට්ටනිය සොයවා ගන්න රජ්ජුරුවෝ සිතුවා.

පුබුදු : ඒ කොහොම ද?

සීයා : රජතුමා සේවකයන් ලවා ගවයාගේ පිටේ තලගෝණියක් බැන්දෙව්වා. ඒ තලගෝණියේ මුල්ලක් සිදුරුකරලයි තිබුණේ.

චමරි : හරි...... හරි....... මට තේරුණා....... ඉතින් ගවයා ගමන් කළ පාර දිගේ තල ඇට වැටෙන්න ඇති.

සීයා : ඔව්, ඔව්, ඒක තමා වුණේ. ඒ තල ඇට පින්නට අසු වුණා.ඊට පස්සේ දින කීපයකින් තල පැළ හැදුණා. තල පැළ වැවුණු පාර දිගේ ගිහින් රජතුමා, ගවයන් තණ කෑ තැනත්, වතුර බීපු තැනත් සොයාගත්තා. ඒ තණකොළ අතරේ වැල්මී වැල් තිබිලා තියෙනවා.

මාලක : එළකිරි රසවත් වෙලා තියෙන්නේ හරක් තණකොළ එක්ක වැල්මී කොළත් කාපු නිසා, එහෙම නේ ද?

සීයා : ඔව්, ළමයිනේ! වැල්මී හරි ම රසයි. ඒ වාගේ ම ඖෂධයක් විධියටත් ප්‍රයෝජනයට ගන්නවා. ඒ විතරක් නෙවෙයි, ඒ කාලය නියං කාලයක් වුණත් එම ස්ථානයේ වතුර නොසිඳී තිබිලා තියෙනවා. ඒ නිසා රජතුමා සිතුවා එතන වැවක් හදන්න හොඳ ම තැනක් කියලා. ඒ අනුව රජතුමා සේවකයන් ලවා කැලෑව එළි පෙහෙළි කෙරෙව්වා. එතැන සෑදූ වැව "මින්නේරි වැව" යනුවෙන් නම් කළා.

මාලක : එතකොට දැන් තියෙන මින්නේරි වැව තියෙන්නේ, එම ස්ථානයේ ද?

සීයා : ඔව්, ඔව්, මහසෙන් රජ්ජුරුවො මින්නේරි වැව හැදෙව්වේ එතැන තමයි.

මලිති : අයියේ.......... මින්නේරි වැව මුහුද වගේ විශාලයි ලු නේ ද?

මාලක : ඔව්, ඔව්, වැවත් විශාලයි. ඒ වාගේ ම හරි සිරියාවයි.

සීයා :- ඒ විතරක් නෙවෙයි, මේ වැව සම්බන්ධ ව නොයෙක් විශ්වාස පවතිනවා.

චමරි : ඒ මොනවා ද? සීයේ.

සීයා : මේ වැව හැදුවේ මහසෙන් රජතුමා නේ. එතුමා දෙවි කෙනෙක් වෙලා, වැව ආරක්ෂා කරනවා ඇති කියලා මිනිස්සු විශ්වාස කරනවා. ඒ නිසා මහසෙන් රජ්ජුරුවන්ට මින්නේරි දෙවියෝ කියලත් කියනවා.

මලිති : අන්න! අම්මලා එනවා. අපි වාහනයට ගොඩවෙමු.

මාලක : තාත්තේ, අපි දැන් ඉස්සරවෙලා ම යන්නෙ කොහාට ද?

තාත්තා : අපි කුරුණෑගල නගරය හරහා, දඹුලු පාර දිගේ දඹුල්ලට යමු.

අම්මා : එහි දී, දවල් කෑම කාලා දඹුලු විහාරය වඳිමු.

සීයා : ඔව්, ඔව්, අපිට හවස් වෙන්න පෙර මින්නේරියට යන්න පුළුවන්.

(මොවුන් රැගත් වාහනය දඹුල්ල බලා පිටත් විය.)

## ක්‍රියාකාරකම්

01) පාඩම කියවා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i. ලොකු මාමාගේ ගෙදර පිහිටා තිබුණේ කොහේ ද?

ii. ගමනට සහභාගි වූ අය කවුරු ද?

iii. මින්නේරි වැව සාදවන ලද්දේ කවුරුන් විසින් ද?

iv. එළකිරි රසවත් වීමට හේතුව කුමක් ද?

v. "මින්නේරි දෙවියන්" යැයි කිව්වේ කාට ද?

02) මෙහි සඳහන් සංවාදය පන්තිය ඉදිරියේ කතාවක් අයුරින් කියන්න.

### භාෂා භාවිතය

01) පහත දැක්වෙන ක්‍රියාපද මුලින් දී ඇති උදාහරණයට අනුව සකස් කොට ලියන්න.

උදාහරණය : ලියයි ⟶ ලියවයි.

i. නටයි ..............................................................

ii. බලයි ..............................................................

iii. කරයි ..............................................................

iv. දුවයි ..............................................................

v. සෝදයි ..............................................................

vi. අඬයි ..............................................................

02) සුදුසු ක්‍රියාපද පහත දී ඇති කොටුවෙන් තෝරා මෙම වාක්‍ය සම්පූර්ණ කරන්න.

i ගොවියා හරකුන් ලවා ගොයම් ...............................................

ii තාත්තා කුලීකරුවා ලවා ගස...................................................

iii අම්මා දරුවා ලවා ගී ............................................................

iv විත්තිකරුවා නීතිඥයා ලවා කරුණු පැහැදිලි ........................

v නැන්දා අක්කා ලවා ඇඳුමක් ..................................................

vi වතුහිමියා කම්කරුවන් ලවා වල්පැළ ....................................

vii වැඩ පරීක්ෂකවරයා සේවකයන් ලවා කාර්යාලය පිරිසිදු ......................................

viii ගෙහිමියා වැඩකාරයා ලවා දර ..............................................

ix විදුහල්පතිතුමා අපා ලවා බුදු මැඳුර පිරිසිදු ............................

x ගුරුතුමිය මා ලවා අභ්‍යාස .....................................................

xi ඇත්ගොව්වා ඇතා ලවා කොට ..............................................

xii සමහරු බළලුන් ලවා කොස් ඇට .........................................

xiii විදුහල්පතිතුමා ශිෂ්‍ය නායකයා ලවා දැන්වීම ........................

xiv අයියා නැගණිය ලවා මල් ......................................................

xv මාමා නැන්දා ලවා ලිපිය ......................................................

**කරවයි.**
**මස්සවයි.**
**පලවයි.**
**බාවති.**
**ලියවයි.**
**කඩවයි.**
**උදුරවයි.**
**පාගවයි.**
**කප්පවයි.**
**අද්දවයි.**
**ගායනා කරවයි.**

03) ඉහත අංක 2 අභ්‍යාසයෙහි සඳහන් ක්‍රියාපදවලට සමාන ක්‍රියාපද සහිත වාක්‍ය පාඩමෙන් තෝරා ලියන්න.

04) පහත දැක්වෙන වචන භාවිත කර වාක්‍ය නිර්මාණය කරන්න.

i කදිමයි

ii මිහිරියි

iii අපූරුයි

iv වැල්මී

v නියං කාලය

05) කථන බසින් දී ඇති වාක්‍ය ලිඛිත බසට හරවන්න.

i මම පොත්පත් කියවලා කරුණු සොයා ගත්තා.

ii මහසෙන් රජතුමා රටතොට ඇවිදින්න ගියා.

iii ඒ තල ඇට පින්නට අසුවුණා.

iv දින කිහිපයකින් තල පැළ හැදුණා.

v සේවකයෝ කැලෑව එළිපෙහෙළි කළා.

06) පහත දී ඇති පදවලට සමාන පද ලියන්න.

i පාසල

ii ගෙදර

iii විශාල

iv මහන්සිය

v ගවයා

vi වනාන්තරය

07) පහත අ, ආ, තීරුවල සඳහන් වාක්‍යාංශ සුදුසු ලෙස ගළපා වාක්‍ය සාදා ලියන්න.

| (අ) | (ආ) |
|---|---|
| අපි මාමාගේ රථයෙන් | හරි ම මිහිරි රසයි. |
| එළකිරි | වෙල්යායක් තිබුණි. |
| අයියා අප ආදරයෙන් | තල ඇට බිමට වැටී තිබුණි. |
| ගවයා ගිය පාර දිගේ | ගමන පිටත් වුණෙමු. |
| වැවට ඇතින් | පිළිගත්තේ ය. |